





# පිලියන්දල බස් බෝම්බයට සිංහලයෙක් උදව් කරලා!



ගිය මස 25 වෙනි සිකුරාදා සවස 6.30 ට පිලියන්දල සිට කහපොළ දකවා දිවෙන මාර්ග අංක 157 බස් රථය සෙනග සියයකටත් වඩා පුරවාගෙන පිලියන්දලින් පිටත්වූ සැනකින් අඩි කීපයක් යන්නටත් මත්තෙන් මහා විශාල හඩක් නගමින් පිපිරී ගියේය. කොටි ත්‍රස්තවාදීන් විසින් අටවන ලද එම බෝම්බයට භික්ෂූන් වහන්සේ නමක් ඇතුළු මගීන් 26 දෙනෙකු මියගිය අතර 70 කට අධික පිරිසකට බරපතල තුවාල සිදුවීය.

එදින මඳ වැසි සහිත වූ බැවිනුත්, වැඩ ඇරී නිවෙස් බලා යන පිරිස හා සවස පන්ති වලට ගොස් එන පාසැල් සිසුන්ද එක පොදියට බසයට නැග ගත්තේ ඉක්මනින් ගෙදර යන අදහසිනි. ඒ අතර කැස්බෑවේ තම පිරිවෙණට යන වේපතඉර ඥාණානන්ද හිමියන් ද සිටියේ ය. තරුණයින් තිදෙනෙක් ගමන් මලු ද රැගෙන බසයට නැගී සෙනග අතරින් මැදට ගොස්, බසය පිටත්වන්නට මොහොතකට පෙර කඩිනමින් බැස ගියහ. ත්‍රීරෝද රියැදුරෙක් ඔවුන් බැස යනවා දැක ඇත.

සිද්ධියෙන් පසු විශාල පොලිස් මෙහෙයුම කින් පිලියන්දල අවට ප්‍රදේශය සෝදිසි කරද්දී ඒ නිවෙස්වල නැවතී සිටි කිලිනොච්චියේ ද්‍රවිඩයින් 19 දෙනෙකු පොලීසියට සොයාගත හැකි විය.

ඔවුන් අතර සිටි තැනැත්තෙක් එදා බස යෙන් බැසගිය එකෙකු ලෙස ත්‍රීරෝද රියැදුරා හඳුනාගත්තේය. ප්‍රශ්න කරද්දී ඔහු තදබල කොටියෙකු බව හෙළිවිය. නම සචි නන්දන් සුදා කරන් වුවත් වසන්තන් යන නමෙන්ද හැඳින් වේ. එහෙත් ඔහු බොරු හැඳුනුම්පතක් සාදාගෙන සිටියේ ලෝරන්ස් ඩේවිඩ් රාජ් ලෙසිනි. ඔහු නැවතී සිටියේ පිලියන්දල සිංහල නිවසක කාමරයක් කුලියට ගෙන සිටි රණසිංහ ආරච්චි ගේ බුද්ධික නමැති සිංහල තරුණයෙකු සමගය. කොළඹ අවට පිපුරුණ බෝම්බ සියල්ල සැළසුම් කළේ වසන්තන්ය. බුද්ධික නමැත්තා ඊට උදව්කර ඇත. තමාට කොටින්ගෙන් රුපියල් දහදාහක් ලැබුණු බව බුද්ධික පොලීසියට කීවේ ය.

***කේ. එල්. කරුණාරත්න* Sri Lanka**

# Sinhala Lesson 121 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### The Present Participle - මිශ්‍ර ක්‍රියාව

Here are more examples of sentences with Present Participles.

පෙරහැරේ නැට්ටුවෝ බෙරගසමින් නටති
සරත් කණ්ණාඩියෙන් බල බලා දත් මැද්දේය
ගෙවිලියෝ කවි කියමින් ගොයම් කපන්නාහ
නපුරු මිනිස්සු බෝම්බ පුපුරවමින් අහිංසකයන් මරති
අපි තෙම් තෙමී වත්තේ සෙල්ලම් කළෙමු
මම පොත්පත් බලමින් විභාගයට ලෑස්තිවෙන්නෙමි
ඔබ වත්තෙහි පාත්ති හදහදා මල් වවන්නෙහිය
ඔබලා බොහෝ මුදල් වියදම් කරමින් ඉගෙනගත්තහුය
කමලා කල්පනාකරමින් ඉවත බලා සිටියාය
කුඩා දරුවෝ හඬ හඬා ගෙට දිවූහ

**Translate the above sentences into English.**

Change the following verbs into Present Participles.

කතාකරනවා, ගොරවනවා, එබෙනවා, ඉල්ලනවා, මහනවා හැරෙනවා, කඩනවා, පීරනවා, සෝදනවා, විකුණනවා

**Practise speaking, listening, reading and writing Sinhala as often as possible.**

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 98

**හරහට :**
1 නාගරික පරිසරය
4 ලපය 5 රෝදය
7 පියකරු වාසස්ථානය
9 ගෙවීගියත් යළිත් එයි
11 මුස්ලිම් පුද බිම

**පහළට :**
1 නරක පුද්ගලයින්ගේ මේවාද නරකය
2 දිනය 3 කදිම
6 මෙය අප රටේ ගෞරව-යෙන් සලකන ඇඳුමකි
8 නාදයක් 10 ඇදය

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | | 3 | ■ |
| 4 | | ■ | 5 | 6 |
| 7 | | 8 | ■ | |
| | ■ | 9 | 10 | |
| ■ | 11 | | | |

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට:** 1 කුනුහරුප 5 වඳ 6 ගිරහකල් 8 නම් 9 නට 10 බාධා
**පහළට:** 2 නුවර 3 හඳහන 4 පතල් 6 ගිමන 7 කම්බා

## දේශ හිතෛෂී ඔබට ආයාචනයක් !



## ජූනි මස 7 වෙනි දා රණවිරු දිනයයි

කොයි දේශයේ සිටියත් එදින සවස 7 ට නිවසේ පහනක් දල්වා අප මව්බිමට ජීවිත පරිත්‍යාග කළ ඒ දහස් ගණනක් වීරෝදාර දූ පුතුන් සිහිකරන්න!

***නොමැරී ඉතිරිව සිටින අප මෙන් ඔවුන් වියපත් වී නොයන්නේ***
***ගලායන කාලය කොතෙක් වුව එයින් වෙහෙසට පත්නොවන්නේ***
***කිසිම යුගයක ප්‍රශංසා මිස බැණුම් ගැරහුම් නොම ලබන්නේ***
***උදෑසන මෙන් සැඳෑ සමයෙත් ඔවුන් අප සිහියේ රැඳෙන්නේ***

## ♥ පැටියෝ ඩාලිං



" පැටියො ඔයා ජනේලෙ වහලා නැනේ...... අන්න කාගෙද පූසෙක් ගෙට පැනලා...."
" නෑ... නෑ... පැටියො... දැට්ස් එ කැට්..."
" හනේ හනේ..මෙහාට ආවයින් පස්සෙ ඔයා-ටත් ගිය කල...? පූසා කැට් වුණා නේ...? "
" මෙහේ විතරක් නෙවෙයි... දැන් ලංකාවෙත් පූසො බලල්ලු නෑ.. ඉන්නෙ කැට්ලා..."

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

### අල සහ නිවිති බැදුම
### Potato -Spinach Fry

***අවශ්‍ය ද්‍රව්‍ය :*** මධ්‍යම ප්‍රමාණයේ අල ගෙඩි 6 ක්
නිවිති කොළ (spinach) රා: 1 ක්
ලියාගත් ලොකු බොම්බයි ලූනු ගෙඩි 1 ක්
ලියාගත් අමු මිරිස් කරල් 4 ක්
පොඩිකරගත් වියලි මිරිස් කරල් පහක්.
සූදුරු තේ හැඳි 1 ක්
සිහිනියට ලියාගත් සුදු ළූණු බික් 4 ක්
තරමක ඉඟුරු කැබැල්ලක්
කුඩුකරගත් අබ ඇට තේ හැඳි ½ ක්
එළවළු තෙල් ටිකක් හා අවශ්‍ය පමණ ලුණු

***සාදන ක්‍රමය :*** නිවිති කුඩා කැලිවලට පිහියකින් ලියා ගන්න. අල පොතු හැර අඟලක තරමේ කැබලි වලට කපන්න. සාස්පානක තෙල් ලිප තබා රත් වුණ විට ඊට අල කැබලි දමා රන්වන් පාට වන තුරු බැදගන්න. ඉන්පසු අල ඉවතට ගෙන තෙල් බේරෙන්න ටිෂු කොලයක් මතට දමන්න. දැන් ඒ සාස්පානටම නිවිති හැර අන් සියළු කළමනා දමා මඳ ගින්නේ බැදෙන්න හරින්න. බැදීගෙන එන විට ඊට නිවිති එකතු කර පියන හැර කූරුගාමින් මඳක් වේලා මැළවෙන්නට හරින්න. එහි දියර සිඳීගෙන එන විට බැදපු අල එකතු කර කළවම් කර ලුණු ද දමන්න. පියන නොවසාම හොඳින් කළවම් කරමින් තවත් ටික වේලාවක් ලිප උඩම තිබෙන්නට හැර බාගන්න.

♦ ***ශාන්තා මනම්පේරි***
ගලවිලවත්ත හෝමාගම Sri Lanka


